(32)

PSC/EST/03-01-32/07/2013

2019.06. 12

ලේකම්

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

**ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියේ තත්ත්ව ආරක්ෂණ සහකාර තනතුර ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියේ ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක තනතුරක් ලෙස අනුමත කර ගැනීම**

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියට මෙ සමඟ අමුණා ඇති ඇමුණුම 01 හි දක්වා ඇති සංශෝධනය එක් කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2019.06.04 දින අනුමැතිය ලබා දී ඇති බව එම කොමිෂන් සභාවේ තීරණය පරිදි කාරුණිකව දන්වමි. (ඇමුණුම 01 - පිටු 01කින් සමන්විතයි)

03. මෙ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ සංශෝධන ඔබ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

ආර්.ඩී.පී.එස්. ධර්මසේන

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ

ලේකම් වෙනුවට

පිටපත් -

Pg (3/29)

1. ලේකම්, රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය - ඔබගේ අංක SSB/01/PERSO/04/0593 හා 2019.02.06 දිනැති ලිපිය අනුව කරු. දැ.ගැ.ස.
2. ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව - කරු. දැන ගැනීම සඳහා
3. ආණ්ඩුවේ රස පරීක්ෂක, ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව - කරු. දැන ගැනීම සඳහා
4. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - කරු. දැන ගැනීම සඳහා
5. ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, උසස්වීම් අංශය රාජ්‍ය සේවා කොමිෂන් සභාව - ඔබගේ අංක PSC/APP/8/5/77/2015 හා 2019.02.28 දිනැති ලිපිය අනුව අ.ක.ස.

Pg (29)

o/c
2019/06/11

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විධායක සේවා ශ්‍රේණිය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය

| වගන්තිය | බඳවා ගැනීමේ පටිපාටියේ පවතින ආකාරය | සංශෝධනය විය යුතු ආකාරය |
|---|---|---|
| 6.1 | ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක තනතුරට අදාළ අනුමත තනතුරු සංඛ්‍යාව 66 | ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක තනතුරට අදාළ අනුමත තනතුරු සංඛ්‍යාව 67 |
| 14 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය. | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය. ඊට අදාළව දැනට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියේ තත්ත්ව ආරක්ෂක සහකාර තනතුරෙහි සේවය කරන නිලධාරිනිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් රස පරීක්ෂක තනතුර අනුමත කළ 2018.09.17 දින සිට ආණ්ඩුවේ රස පරීක්ෂක තනතුරේ III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කළ යුතුය. අදාළ නිලධාරිනිය එම තනතුරට අන්තර්ග්‍රහණය කරන අවස්ථාවේදී එදිනට ආණ්ඩුවේ රස පරීක්ෂක තනතුරේ III ශ්‍රේණියේ සේවයේ නියුතු ඇයගේ සේවා කාලයට සමාන වූ හෝ ඊට වැඩි වූ සේවා කාලයක් ඇති සියළුම නිලධාරීන්ට වඩා පහළ ජ්‍යෝෂ්ඨතාවයක තැබිය යුතුය. |
| තත්ත්ව ආරක්ෂණ සහකාර සහ තත්ත්ව ආරක්ෂණ විද්‍යාඥ තනතුරුවලට අදාළව පවතින වගන්ති | | එම තනතුරු දෙක යටපත් කර ඇති බැවින් තත්ත්ව ආරක්ෂණ සහකාර සහ තත්ත්ව ආරක්ෂණ විද්‍යාඥ තනතුරුවලට අදාළ සියලුම විධිවිධාන බඳවා ගැනීමේ පටිපාටියෙන් ඉවත් කරන්න. |